# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,812 — 1961 දෙසැම්බර් 9 වැනි සෙනසුරාද — 9.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 9 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

1961 අංක 9 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 17 වෙනි නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ, ඒ නියෝගයේ කාර්‍ය සඳහා පත් කරනු ලැබූ නිසි බලධරයා විසින් දෙනු ලබන විධාන.

ඩබ්ලිව්. ඇල්. ප්‍රනාන්දු,
නිසි බලධරයා.

1961 දෙසැම්බර් 9, කොළඹ.

විධාන

1. කිසිම තැනැත්තකු විසින්,

(අ) නිසි බලධරයා විසින් පළකොට ප්‍රසිද්ධ කිරීම සඳහා සම්මත කරනු ලැබුවහොත් හැර, එසේ ම

(ආ) සම්මත කරනු ලැබූ ආකාරයට හැර,

මේ විධානවල උපලේඛනයෙහි විස්තර කරනු ලැබූ යම් ලේඛනයක්, චිත්‍ර නිරූපණයක්, ඡායාරූපයක්, සිනමා චිත්‍රපටියක් ප්‍රසිද්ධ නො කළ යුතු ය.

2. මේ විධිවිධානවල උපලේඛනයෙහි විස්තර කරනු ලැබූ යම් ලේඛනයක්, චිත්‍ර නිරූපණයක්, ඡායා රූපයක් හෝ සිනමා චිත්‍ර පටියක් ප්‍රසිද්ධ කිරීමට පෙර, එය ප්‍රසිද්ධ කිරීම පිණිස නිසි බලධරයා ලවා සම්මත කරවා ගැනීමේ කාර්‍යය සඳහා නිසි බලධරයා වෙත යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් ඔහු ඉදිරියේ ප්‍රදර්ශනය කළ යුතු ය.

3. කිසි ම තැනැත්තකු විසින්,

(අ) අමාත්‍ය මණ්ඩලයේ ලේකම් විසින් ඇමතිවරයන් සියල්ලට ම හෝ ඉන් යමකුට යවනු ලැබූ ලේඛනයක ඇතුළත් දෙයක් හෝ ඇතුළත් දෙයක කොටසක් හෝ ඇතුළත් දෙයක සාරාංශයක් හෝ ඇතුළත් දෙයක සාරාංශයක කොටසක් හෝ ඇතුළත් දෙයක් යැ යි හෝ ඇතුළත් දෙයක කොටසක් යැ යි, හෝ ඇතුළත් දෙයක සාරාංශයක් යැ යි හෝ ඇතුළත් දෙයක සාරාංශයක කොටසක් යැ යි හෝ හැඟවෙන යම් කරුණක් හෝ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ රැස්වීමක වාර්තාවක් හෝ වාර්තාවක කොටසක් හෝ වාර්තාවක සාරාංශයක් හෝ වාර්තාවක කොටසක සාරාංශයක් හෝ එබඳු රැස්වීමක වාර්තාවක් යැ යි හෝ ඉන් කොටසක් යැ යි හෝ එහි සාරාංශයක් යැ යි හෝ එහි කොටසක සාරාංශයක් යැ යි හෝ හැඟවෙන යම් කරුණක් හෝ

(ඇ) අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් හෝ තීරණයක කොටසක් හෝ තීරණයක සාරාංශයක් හෝ තීරණයක කොටසක සාරාංශයක් හෝ ඒ අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් යැ යි හෝ එහි කොටසක් යැ යි හෝ එහි සාරාංශයක් යැ යි හෝ එහි සාරාංශයක කොටසක් යැ යි හැඟවෙන යම් කරුණක් හෝ

(ඈ) අමාත්‍ය මණ්ඩලයේ රැස්වීමක දී සාකච්ඡා කරනු ලැබූ යම් කරුණක් හෝ එසේ සාකච්ඡා කරුණක් යැ යි හැඟවෙන කරුණක් හෝ

(ඉ) වැඩ වර්ජනයකට හෝ පිටමං කිරීමකට සම්බන්ධ වූ යම් ක්‍රියාවක්, යෝජිත ක්‍රියාවක් හෝ අදහසක්

(ඊ) ජාතිය, ආගම හෝ භාෂාව පිළිබඳව හැඟීම් ඇවිස්සීමට හෝ උද්වේගය ප්‍රකෝප කරවීමට තුඩු දෙන යම් කරුණක්, ක්‍රියාවක් හෝ අදහසක්

කිසි පුවත් පතක පළ නො කළ යුතු ය.

2283—ජේ. ඇන්. ආර් 260—7,020 (61/12)

එසේ වුව ද නිසි බලධරයා විසින් පුවත් පත්වල පළ කළ යුතු ය යි බලය දෙනු ලැබූ යම් කරුණකට මේ විධානයෙහි පෙරාකුව ම වූ විධිවිධාන අදාළ නො විය යුතු ය.

4. මේ නියමවල—

" අමාත්‍ය මණ්ඩලය " යන්නට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබූ කාරක සභාවක් ඇතුළත් වේ.

" නිසි බලධරයා " යන්නෙන් 1961 අංක 9 දරණ හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 17 වෙනි නියෝගයෙහි කාර්ය සඳහා පත් කරනු ලැබූ නිසි බලධරයා අදහස් වේ ;

" පුවත් පත " යන්නට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ අන්කිසි ප්‍රකාශනයක් ඇතුළත් වේ.

උපලේඛනය

පහත දැක්වෙන කරුණුවලින් යමක් සටහන් වන හෝ එබන්දක් පිළිබඳ ව තොරතුරක් සපයන ලේඛනයක් හෝ එබන්දක චිත්‍ර නිරූපණයක්, ඡායා රූපයක් හෝ සිනමා චිත්‍ර පටියක්. එනම් :—

(අ) සාහසික ක්‍රියා, සාමය කඩ කිරීම, නීතියට අකීකරු වීම හෝ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් විසින් නීතිය ක්‍රියාවෙහි යොදවනු ලැබීමට බාධා කිරීම ;

(ආ) ප්‍රසිද්ධ රැස්වීම ;

(ඇ) ප්‍රසිද්ධ කථා ;

(ඈ) පෙරහැරවල් හෝ පෙළපාලි ;

(ඉ) 40 වැනි අධිකාරය වන මහජනාරක්ෂක ආඥාපනත යටතේ හදිසි නියෝගයක් හෝ එබඳු නියෝගයක් යටතේ දෙනු ලැබූ ආඥාවක් හෝ නියමයක් අනුව කරනු ලැබූ යම් ක්‍රියාවක් ;

(ඊ) පොලිසියෙහි, ලංකා යුද්ධ හමුදාවෙහි, රාජකීය ලංකා නාවික හමුදාවෙහි හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවෙහි ස්වභාවය, තත්ත්වය, යාම ඊම හෝ කටයුතු ;

(උ) 1961 දෙසැම්බර් 8 වෙනි දින අංක 12,798 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබ, මහජන ආරක්ෂක පනතෙහි 2 වෙනි වගන්තිය යටතේ අග්‍රාණ්ඩුකාරවරයාගේ ප්‍රකාශනයෙන් සඳහන් කරන ලද මහජන හදිසි තත්ත්වයට සම්බන්ධ වන තරමට හා සම්බන්ධ වන තරමට පමණක් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි පරිපාලනයට යොමු වන යම් දෙයක්.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.